ශ්‍රී. බු. ව. 2554 මැදින් මස කලාපය, රා. ව. 2011 ක් වූ මාර්තු 19 වන දින

මාතර,ශ්‍රී සුදර්ශි මහ පිවෙන්හි නියෝජ්‍ය පිවෙනාධිපති දෙවිනුවර, කපුගම, සුධර්මාරාමාධිපති

**ශාස්ත්‍රපති පූජ්‍යපාද කපුගම සුගතසාර ස්වාමීන්වහන්සේ විසිනි.**

**නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස ද්‍යද්‍යද්‍ය**

# හැන්දක් නොවී දිවක් වෙමු .

(ධමමපදයේ බාල වගගය ඇසුරෙනි.)

**පින්වත්නි,**

**අද මැදින් පුර පසළොස්වක පොහොය දිනයයි. බුදුරජාණන් වහන්සේ රජගහනුවර වේළුවනාරාමෙයෙහි වැඩ සිටින බව දැනගත් පියරජතුමා තම පුතණුවන් දැකගැනීමේ කැමැත්තෙන් ඇමතිවරු 09 දෙනෙක් පිරිවර සහිතව යැවූ නමුත් තම අදහස ඉටු නොවිනි. 10 වන වාරයෙහි යැවූ කාළුදායි ඇමතියා එහි ගොස් කිඹුල්වත්පුර නුවර ගැන පරිසර වර්ණනාවක් කළ පසු බුදුන්වහන්සේ කිඹුල්වත්පුර නුවරට වැඩම කිරීමට තීරණය කළ සේක. එම තීරණය ගෙන කිඹුල්වත් පුර නුවරට වැඩම කිරීමට ආරම්භ කළේ අද වැනි මැදින් පුර පසළොස්වක පොහොය දිනයකයි.**

කාලුදායි ඇමතිවරයා තථාගතයන්වහන්සේට කියා සිටියේ කිඹුල්වත් පුර නුවර පාර දෙපස ගස්වල පැරණි කොළ ඉවත් වී ගිනි සිළු වැනි අලුත් දළු දමා ඵල අපේක්ෂාවෙන් සිටින බවයි. මෙම පරිසර වර්ණනාවෙන් කියවෙන්නේ තම ඥාතීන්වන ශාක්‍යයින් පැරණි අදහස් ඉවත් කරගෙන අලුත් අදහස් පිළිගැනීමට සැදී පැහැදී සිටින බවයි. ඒ නිසා බුදුන්වහන්සේ ඉදිරිපත් කළ නව චින්තනය තම ඥාතීන්ට ඉදිරිපත් කිරීමට සූදානම් වූ අද වැනි දිනක අපිත් පැරණි අදහස් ඉවත ලා නව චින්තනයකට හුරුවී දෙලොව ජය ගැනීමට උත්සාහවත් වෙමු.

ධමම පදයේ බාල වග්ගයට අනුව එදා භාරතීය සමාජය තුළ ජීවත් වූ චරිත දෙකක් මුල් කරගෙන බුදුන්වහන්සේ හැම කාලයටම ගැළපෙන දේශනාවක් පවත්වා ඇත. සැවැත්නුවර ෙ[තවනාරාමයෙහි උදායි නම් හිමි නමක් වාසය කළහ. දහම් දැනුම නැති මුන්වහන්සේ උඩාගුකමින් යුක්තයි. මනා පෙනුමකින්  යුක්ත සිරුරකින් යුක්තය. මුන්වහන්සේ තමාගේ තරම නොදැන බණ දෙසන ශාලාවෙහි පුටුවක හිඳගෙ න සිටී. උදායි හිමියන්ගේ තත්වය නොදන්නා ආගන්තුක භික්ෂූන්වහන්සේලා ඒ හිමියන්ගෙන් ධර්මය පිළිබඳ ප්‍රශ්න ඇසූ නමුත්  පිළිතුරු දීමට නොහැකිය. එහිදී එම භික්ෂූන්වහන්සේලා බුදුන්වහන්සේ වෙත එළඹ ප්‍රකාශකලේ බුදුරජාණන් වහන්සේ ලාංග හිඳගෙනත් මේ උදායි හිමියන්ට ධර්මය අවබෝධ වී නැති බවයි. එහිදී

බුදුන්වහන්සේ දේශනා කළේ 'බාලයෙක් දිවි ඇති තෙක්ම පණ්ඩිතයෙක් ඇසුරු කල ද ඔහු පණ්ඩිතයා තුළ පවත්නා ධර්මය අවබෝද කර නොගන්නා බවයි. ඔහු උපමා කොට ඇත්තේ ව්‍යඤ්ජනවල රස නොහඳුනන හැන්දකට ය.

යාව ජීවමපි චෙ බාලො පණ්ඩිතං පයිරුපාසති

නසොධම්මං විජානාති දබ්බී සූප රසං යථා

යනුවෙන් දැක්වූයේ

එම ධම් දේශනාව යි.

බුදුරජාණන් වහන්සේ දවස මෙවැනි චරිත ඇති හැඳි තිබූ බව පෙනේ. ජේතවනාරාමයේ හිඳගෙන බුදුන්වහන්සේගේ ධර්මය ඇසුවත් දේවදත්ත හිමිට ධර්මය හුනාගෙන නිවන අවබෝධ කර ගැනීමට නොහැකි විය.

'ඉඳ ඉඳ එක වෙහෙර - විඳ විඳ දහම් මනහර
සිඳ බිඳ දුක් සසර - අනේ ඳු දෙව්දත් නොදුටි මොක්පුර

යනුවෙන් වෑත්තෑවේ හිමියන් පැවසුවේද එවැනි හැන්දක් ගැනය. එදා මෙන්ම අදත් එවැනි හැඳි ගිහි වශයෙන් හා පැවිදි වශයෙන් සිටිනා බව අමතක නොකළ යුතුයි. එවැනි හැඳි දිවක් කරවීම මෙම දහම් පණිවිඩයේ අරමුණයි.

බුදුන්වහන්සේ දිනක් පා ගමනින් වැඩම කරද්දී කැප්පිටියා වන ලැහැබක කුමාරවරුන් පිරිසක් කව්රු හෝ සොයමින් සිටිනා බව දුටහ. මේ කුමාරවරු හැඳින්වුයේ භද්දවග්ගිය කුමාරවරුන් හැටියටයි. ඔවුන්ගේ 29 දෙනෙකුට භාර්යාවරු සිටියහ. එක් කුමාරයෙකුට භාර්යාවක් නොසිටි නිසා තාවකාලිකව කාන්තාවක් ගෙන ආහ. ඒ කාන්තාව සොර කතකි. ඇය අර කුමාරවරුන්ගේ ප්‍රමාද දෝෂයක් දැක ඔවුන්ගේ ආභරණ රැගෙන පලා ගියාය. මේ කුමාරවරු 30 දෙනා කැළයේ සොයමින් ඇවිද්දේ එම සොර ස්ත්‍රිය යි. මේ දුටු බුදුන්වහන්සේ ඒ කුමාරවරුන්ගෙන් ඇසුවේ කාන්තාවක් ගැන සෙවීම උතුම් ද තමා ගැන සෙවීම උතුම් ද කියාය. එහිදී ඒ කුමාරවරුන් කියා සිටියේ තමා ගැන සෙවීම උතුම් බවයි. එහිදී බුදුන්වහන්සේ දේශනා කළ ධර්මය ඉතා ඉක්මනින් ඒ කුමාරවරු තේරුම් ගත්හ. එහිදී බුදුන්වහන්සේ දේශනා කළේ ' නුවණැත්තා නුවණැත්තෙක්ව මොහොතක් ඇසුරු කළත් ඒ නුවණැත්තා ළාග පවත්නා යුක්ති ධර්මය හඳුනා ගන්නා බවයි.

මුහුතතමපි චෙ විඤ්ඤූ පණ්ඩිතං පයිරුපාසති

ඛිපපං ධමමං විජානාති ජිව්හා සුපරසං යථා

යනුවෙන් දැක්වුයේ එම ධර්ම දේශනය යි. මෙහි නුවණැත්තා හඳුන්වා ඇත්තේ හොද්දෙහි රස ඉතා

ඉක්මනින් හඳුනාගන්නා දිවටයි. එවැනි දිව වැනි අය එදා භාරතීය සමාජය තුළ ජීවත් වූ බව පෙනේ. උපතිස්ස පරිබ්‍රාජකයාට අස්සජි හිමියන් මුණ ගැසිණි. අස්සජි හිමියන් 'යෙ ධමමා හෙතුපපභවා..' යන ගාථාව දේශනා කළහ. උපතිස්ස පරිබ්‍රාජකයා ඒ මොහොතේම ධර්මය අවබෝධ කර ගත්හ. එසේනම් සැරියුත් මහ රහතන් වහන්සේ ඉතා වටිනා දිවක් ලෙස හැඳින්විය හැක.

මෙම දේශනාවට අනුව සලකා බලනවිට ගිහි පැවිදි වශයෙන් දෙවදෑරුම් වන මේ සමාජය තුළත් ඉහත කී ආකාරයේ හැඳි වැනි චරිතත් , දිව වැනි චරිතත් දැකිය හැක. මේ සදහම් පණිවිඩයේ අපේක්ෂාව වනුයේ හැඳි වැනි චරිතවලින් යුක්ත අය දිව වැනි චරිතයකට පරිවර්තනය කර ගැනීමයි. අද වැනි පුර පසළොස්වක දිනක තථාගතයන් වහන්සේ තම ඥාතීන් බැලීමට යාමට තීරණය කළේ ශාක්‍යයින් අතර ජීවත් වූ හැඳි වැනි අය දිවක් කර ලීම සඳහායි.

බුදුරජාණන් වහන්සේ යනු මේ සමාජය තුළ උපන් උපරිම පෞරුෂත්වයෙන් යුක්ත යුක්ති ගරුක මනුෂ්‍යයෙකි. ඒ මනුෂ්‍යයාට යමක් වරදින්නට බැරි බව අප කාගේත් විශ්වාසය විය යුතුය. බුදුන්වහන්සේ පිළිබඳ පවත්නා අචල ශ්‍රද්ධාව යනු එයයි. නමුත් සමහර හැඳි වැනි අයට තථාගතයන් වහන්සේ ගැන සැක ඇතිවී තිබේ. එවැනි අය කියන්නේ බුදුන්වහන්සේටත් වැරදුනු තැනක් ඇති බවයි. ඒ වැරදුන තැන හැටියට දක්වන්නේ

රාහුල කුමරු පැවිදි කිරීමයි. ගුවන් විදුලි ප්‍රවෘත්ති ප්‍රකාශ ආතර බි.බී. සී. යනුවෙන් ප්‍රවෘත්ති ප්‍රකාශයක් ප්‍රකාශයට පත්වේ. එහි පසුගිය දිනවල කියූ ප්‍රවෘත්තියක් වනුයේ කුඩා ළමයි පැවිදි කිරීම වරදක් බවයි. එය මානව නීති උල්ලංඝනය කිරීමක් ලු. මේ ප්‍රවෘත්තිය ඇසූ සමහරු එය දේව භාෂිතයක් ලෙස සලකා ක්‍රියාකරමින් රාහුල හිමි කුඩා කාලයේ පැවිදි කිරීම වරදක් හැටියට පෙන්වා දෙයි. යශෝදරා දේවිය තම පුතාට කීවේ පුතේ අර පාරේ ගමන් කරන්නේ පුතාගේ පියාය. එහි ගොස් දායාද ඉල්ලා ගන්න කියාය. මවගේ අවසරය පරිදි රාහුල පුතා පියාගෙන් දයා ද ඉල්ලීය. තථාගතයන් වහන්සේ රාහුල කුමරු කැඳවාගෙන ගොස් සැරියුත් හිමියන්ට පවරා පැවිදි කරවූහ. මවගේ හා පියාගේ කැමැත්තෙන් පුතා පැවිදි කිරීම වරදක් ද? එය වරදක් නම් සුද්ධෝදන රජුගේ ඉල්ලීම මත රාහුල හිමියන් සිවුරු හරවා ගෙදර එක්කරගෙන යෑමට සීයාට පැවරිය යුතුයි. ඉහත කී ප්‍රවෘත්ති ප්‍රකාශ දේව භාෂිත ලෙස ක්‍රියා කරන සමහරු බුදුන්වහන්සේට වැරදුන තැනක් ඇත කියා කරන ප්‍රකාශ තුළින් පෙනී  යන්නේ ඔවුන් හැඳි වැනි චරිත බවයි.

බුදුරජාණන් වහන්සේ තරම් වටිනා දිවක් මේ ලෝකයේ පහළ වී නැත. රජගෙදරට වැඩම කළ අවස්ථාවේදී යශෝදරා දේවිය සිටි තැනට වැඩම කළ බව බුද්ධ චරිතයෙහි සඳහන් වේ. එසේ කළේ තම පැරණි භාර්යාව තමා වෙනුවෙන් කැපකළ ජීවිතය අවබෝධ කරගෙන සිටි නිසයි. තම ස්වාමි පුත්‍රයා ගිහිගෙය

අත්හැර ගියවිට යශෝදරා දේවිය එතුමාට ආශිර්වාද කළ හැටි අපට මතකය.

කැලේ තිබෙන කොයි දේවත් රස වේවා

මලේ බඹරු මෙන් පිරිවර ඇති වේවා

අච්චේ තිබෙන රැස්මාලා අඩු වේවා

ගව්වෙන් ගව්ව දිව මාළිග සැදේවා

යශෝදරා දේවිය දිවක් වැනි බිරිඳකි. තම සැමියාට අවලාද කිරිම වෙනුවට එතුමිය කළේ ආශිර්වාද කිරීමයි. ඊට හේතුව තම ස්වාමියා හොඳින් අවබෝධ කර ගෙන සිටීමයි.

නූතන සමාජය දෙස බලන විට පෙනී යන්නේ ගිහි පැවිදි යන සමාජ දෙකේම හැඳි බහුලව පවත්නා බවයි. සමාජ ගැටලු රාශියකට හේතුව එම දුර්වල චරිත ලක්‍ෂණය යි. ඒවා සකස් කර ගතහොත් බොහෝ ගැටලු නිරාකරණය වෙයි.

විහාරස්ථානයක පොඩි හාමුදුරුවරු 3 නමක් වාසය කරති. වර්ෂා දිනයක එම පොඩි හාමුදුරුවන් තුන් නමගෙන් දෙනමක් වැස්සේ මිදුලේ ඇවිදිමින් ඉතා සතුටින් කඩදාසි ඔරු සකස් කරමින් සතුටුවෙති. එක

නමක් නිහාඩව පසෙක වී සිටි. එදින සවස ලොකුහාමුදරුවෝ සතුටු නොවී පසෙකට වී බලා සිටි පොඩි හාමුදුරුවන් කැඳවා කරුණු විමසීය. එවිට පොඩිහාමුදුරුවන් කීවේ ' ලොකු හාමුදුරුවනේ , අපේ ගේ තෙමෙනවා. මගේ දෙමාපියන් සහෝදර සහෝදරියන් තෙමෙන බව මතක් වෙන විට මට සතුටින් සෙල්ලම් කරන්න හිතෙන්නේ නෑ. ලොකු හාමුදුරුවෝ හොඳ දිවකි. අර පොඩි හාමුදුරුවන්ගේ පියා කැඳවා ගෙදර වහලය සකස් කිරීමට ලී දාඩු දී උළු සෙවිලි කර දුන්හ. දැන් ඒ පොඩි හාමුදුරුවන් තරුණ භිකෂුනමකි. සිවුරු හැර ගෙදරට යාමට සිතෙන නමුත් ලොකුහාමුදුරුවන් තනිකර දමා යාමට නොහැකි බව කියයි. ඒ අනුව පොඩි හාමුදුරුවෝ ද හොඳ දිවකි. මෙවැනි දිව වැනි චරිත ඇත්නම් සාංග සසුන තුළ ගැටලු අවම වෙයි.

දායක මත්මහත්මයෙකුගේ බිරිඳක් අසනීප වී රෝහල්ගත කළේ රාත්‍රී 12 ටයි. මහත්මා රෝහලේ ඉස්තෝප්පුවේ වාඩි වී සිටින්නේ තම බිරිඳ රැක බලා ගැනීමටයි. ඔහුගේ සිතේ මහා ගින්දරකි. අලුයම 4 වන විට ඔහුට සිහිවුයේ පන්සලට උදේ දානය තම නිවසින් බවයි. ඔහු වහාම ගෙදර අවුත් කිරි හොද්දක් හදාගෙන පාන් ද රැගෙන පන්සලට ගිය විට ලොකු හාමුදුරුවන් ඉතා තදින් දෝෂාරෝපණය කළේ උදේ දානයට පාන් ගෙන ආ බැවිනි. ඒ සාංග සසුන තුළ වැඩ සිටින හැඳි වැනි චරිතය. එම දායක මහතා පත්ව තිබූ චිත්ත පීඩාව මත දානය අමතක වීමට ඇති ඉඩකඩ බොහෝය. නමුත් මොහු එසේ නොකොට තම යුතුකම කළ විට එය අගය

කිරීමට තරම් හැකියාවක් නැති එම භික්ෂුව හැන්දක් ලෙස හැඳින්විය හැක. ඒ නිසා එවැනි හැඳි වහාම දිවක් බවට පරිවර්තනය වීමට කාලය උදාවී ඇත. සමහර ලොකු හාමුදුරුවරු දානය ගෙන ඒමට අවශ්‍ය භාජන රැගෙන යාමට දායක මහතා පන්සලට ආවිට ගෙදර තොරතුරු විමසයි. එසේ අසන්නේ ගෙදර අය අසනීප කම්වලින් තොරව හොඳින් සිටී ද කියා දැන ගැනීමටයි. ගෙදර අය කරදරයකින් සිටින අවස්ථාවක නම් දානය නවතා ඔවුන්ට සහන සලසන හැඳි වැනි බුද්ධ පුත්‍රයින් වහන්සේලා ද දැක ගත හැකිය.

ගම හා පන්සල වෙනුවෙන් මුළු ජීවිතයම කැප කළ ස්වාමීන් වහන්සේ නමක් හතිය රෝගයෙන් පෙළෙයි. දායක ගෙදරක පාංශුකූලයකට 10 නමක් අවශ්‍ය බව ඒ හිමියන්ට කී විට අසනීපකම් තබා ගෙනත් උන්වහන්සේ එම ආගමික යුතුකම ඉටුකිරීමට මහා සංඝරත්නයට ආරාධනා කළහ. තමන් වහන්සේට ඒ කටයුත්තට සහභාගී වීමට නොහැක්කේ හතිය වැඩි නිසා බව කී විට එම දායකයා කීවේ ලොකුහාමුදුරුවනේ අනිවාර්යයෙන්ම වැඩම කළ යුතු බවයි. මම මේ අසනීපය තබාගෙන ඔය කන්දට ගියොත් අපවත් වේවි කියා කී විට දායකයා කීවේ එහෙම උනොත් ආදාහනය කරන බවයි. දායකය මහතාගේ ඉල්ලීම ඉටුකළ ලොකුහාමුදුරුවන් එම පාංශුකූලයට වැඩම කොට සවස පන්සලෙන් පිට වි ගියේ නැවත එම පංසලට නොඒමේ අදහසිනි. ලොක්‍ාහමුදුරුවන් කොතැනක සිටිනවා ද කියා දායකයින් තාම නොදනී. එවැනි හැ්දි වැනි දායකයින් ඕනෑතරම්

හොයා ගත හැක. නමුත් තමාගේ ගම වෙනුවෙන් පන්සල වෙනුවෙන් දිවිහිමියෙන් ක්‍රියාකොට රෝගීවූ ලොකුහාමුදුරුවරු තම පණසේ සලකා ආරක්ෂා කරන දිව වැනි දායකයින් ද අප අතර සිටින බව සතුටින් සිහිපත් කළ යුතුයි.

අඹු සැමියන් හැටියට ජීවත්වන අය අතරද බොහෝ හැඳි තිබෙන බව සිහිපත් කළ යුතුය. විවාහ ගිවිසගන්නා දිනයෙහි අත් දෙකේ ඇඟිලි නූලකින් බැඳීම චාරිත්‍රයකි. සිත් දෙක එකට නොබැඳේනම් නූල්වලින් ඇඟිලි බැඳීමෙන් පලක් නැත. මේෂන් වැඩ කරන ස්වාමි පුත්‍රයෙක් දිනක් ගෙදර ආවේ සවස 6 ට පමණය. කොන්ක්‍රීට් වැඩක් කොට සවස්වී ගෙදර ආ ඔහු එදිනට ලැබුනු මුදල මේසය මත තබා ඇඳේහි ඇලවී ටිකක් විවේක ගත්හ. ගතවුයේ මොහොතකි. ස්වාමි දියණිය ඉදිරියට අවුත් කඩේට ගොස් මොනවාහරි ගේන්නේ නැද්ද කියා මහ හඩින් කෑ ගැසීය. ස්වාමි පුත්‍රයා කියා තිබෙන්නේ අද මගේ තුනටිය අමාරුවක් ඇති බැවින් කඩේ යාමට නොහැකි බවයි. එවිට ස්වාමි දියණිය කියු දෙය ඇසු ස්වාමි පුත්‍රයා බලවත් කල කිරීමට පත්විය. තමා වෙනුවෙන් උදේ පටන් රෑවන තුරුම දහඩිය වගුරුවා වෙහෙසෙන ස්වාමියා එක් දිනක් තම අපහසුව කීවිට එය තේරුම් ගැනීමට බැරි ඇය හැන්දකි. එවැනි අවස්ථාවලදී මවත් තම දරුවකුට සළකන ආකාරයෙන් ක්‍රියා කරන ස්වාමි භාර්යාවරුද අප සමාජයේ දැකගත හැක. එවැනි දිවක් වැනි ස්වාමි දියණියක් ලැබුනොත් ඒ ස්වාමියා කොතරම් සැනසීමක් ලබනවාද යන්න සිතා ගත

හැක. එවැනි හැඳි ඇත්නම් දිවවල් වීමට අධිෂ්ඨානය කරගත යුතුය.

තම ස්වාමි දියණිය අසනීප වී බෙහෙත් ගැනීමට ගියාය. එවැනි අවස්ථාවක කොතරම් වැඩ තිබුණත් ස්වාමි පුත්‍රයා ද ඒ ගමනට යා යුතුයි. නමුත් මේ ගෙදර ඒ තත්වය නැත. බෙහෙත් ගෙන ඒමට තනියෙන් ගිය ස්වාමි දියණිය කීවේ තමාට නිව්මෝනියා තත්ත්වයට ලෙඩේ උත්සන්න වී ඇති නිසා ඇල්වතුර අල්ලන්නවත් එපා කියා දොස්තර මහතා කී බවයි. එසේ කීවිට ස්වාමියා කිව යුත්තේ එහෙමනම් අද කෑම පිළියෙල කිරීමට මහන්සි වන්න එපා. කඩෙන් මොනවහරි ගෙනවුත් කමු කියා නොවේ ද ? එසේ කීවේ නැත. මැය ඉතා අමාරුවෙන් එළවළු දෙකක් හදා බතක් පිළියෙල කොට ඇඳට වැටී නිදා ගත්තාය. ස්වාමි පුත්‍රයා එදා දවල්ට කෑම කෑවේ නැත. කෑමටික මේසයට නොගැනීමේ වරද නිසාය. මේ ස්වාමිපුත්‍රයා  හැන්දකි. නමුත් රටේ ජීවත්වන ඇතැම් ස්වාමි පුත්‍රවරු තම ස්වාමි දියණියගේ අසනීපය වෙනුවෙන් කැප වන හැටිත් ගෙදර දොර සියලු කටයුතු කරන හැටිත් දැකින විට පෙනී යන්නේ ඔවුන් දිව්‍යමය ස්වාමි පුත්‍රවරු බවයි.

ගිහි ගෙවල්වල ජීවත්වන දරුවන් අතරද මෙවැනි හැඳි වැනි චරිත ඇති බව පෙනේ. දෙමාපිය දෙපල තමා වෙනුවෙන් කැපවන හැටි දැක දැකත් ඔවුන් කරදරයට පත් කරන දරුවන් මේ සමාජයේ දැකිය හැක. ඔවුන් හැඳි වැනිය. තම දෙමාපියන්ගේ ආර්ථික

**අපහසුතා දකින දරුවන් දෙමාපියන්ට කරදර නොකර ඔවුන්ගේ සැනසීම ඇතිවන ලෙස ක්‍රියා කරනු පෙනේ. දිවක් වැනි එවැනි දරුවන් දේව දරුවෝය.**